සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2022(2023)
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2022(2023)
General Certificate of Education (Adv. Level) Examination, 2022(2023)

**නර්තනය - (දේශීය) II**
நடனம் - (தேசிய) II
Dancing - (Indigenous) II

**52 S II**

*පැය තුනයි*
*மூன்று மணித்தியாலம்*
*Three hours*

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

**උපදෙස්:**

* මෙම ප්‍රශ්න පත්‍රය **I, II** හා **III** වශයෙන් කොටස් **තුනකින්** සමන්විත වේ.
* **I** කොටසේ **1** හා **2** ප්‍රශ්න අනිවාර්ය වේ.
* **II** හා **III** කොටස්වලින් **අවම වශයෙන් එක්** ප්‍රශ්නය බැගින් තෝරාගෙන, අනිවාර්ය ප්‍රශ්න **දෙක** ද ඇතුළු ව ප්‍රශ්න **පහකට** පිළිතුරු සැපයිය යුතු ය.
* සෑම ප්‍රශ්නයකම **(i)** කොටසට ලකුණු **06**ක් ද **(ii)** කොටසට ලකුණු **06**ක් ද **(iii)** කොටසට ලකුණු **08**ක් ද වශයෙන් මුළු ලකුණු **20**ක් බැගින් හිමි වේ.

## I කොටස

**1.** (i) පහත සඳහන් බෙර පද අතුරෙන් ඔබ උගත් සම්ප්‍රදායට අයත් බෙරපදය තෝරාගෙන මහ තනිතිතට අනුව සමගුණ, දෙගුණ සහ සිව්ගුණට ප්‍රස්තාර කරන්න.

(අ) තරිකිට

(ආ) කිටිතක

(ii) පහත සඳහන් කවි පදය අවග්‍රහයෙන් ආරම්භ කර මහ තනිතිතට අනුව ප්‍රස්තාර කරන්න.

"නොමදින් වීකුම් පාලා සැදෙමින් යුදට ජය ලන්දෙසින් සම්දුන් එ ජනරාලා"

(iii) මුසලඩි වන්නමේ අඩව්ව හෝ නළුගීතිකා තාලය සින්දු වන්නමේ ඉරට්ටිය හෝ නාග ගජගා වන්නමේ අඩව්ව හෝ ප්‍රස්තාර කරන්න.

**2.** ප්‍රාථමික යුගයේ සිට මානවයාගේ ඇදහිලි-විශ්වාස සහ සමාජ අවශ්‍යතාවන් නර්තනය විධිමත් ලෙස සංවර්ධනය වීමට හේතු වී ඇත.

(i) ආදි මානවයාගේ අභිචාර විධි **දෙකක්** ඇසුරෙන් ඉහත ප්‍රකාශය පැහැදිලි කරන්න.

(ii) මහනුවර යුගයේ ශ්‍රී ලාංකේය නර්තන කලාවේ ස්වභාවය, විදේශිකයින්ගේ වාර්තා **දෙකක්** ඇසුරෙන් සාකච්ඡා කරන්න.

(iii) ක්‍රි. ව. 1950 – ක්‍රි. ව. 1970 කාල පරිච්ඡේදයේදී නර්තන කලාවේ ප්‍රගමනය පිළිබඳව සාධක **හතරක්** ඇසුරෙන් පහදන්න.

## II කොටස

**3.** ඇදහිලි-විශ්වාස මත පදනම් වූ ශාන්තිකර්ම මගින් තත් කාලීන සමාජ සංස්කෘතික පසුබිම පිළිබිඹු වේ.

(i) වලියක් මංගල්‍යය ශාන්තිකර්මය පැවැත්වීමේ අරමුණු පැහැදිලි කරන්න.

(ii) කිරිමඩුව ශාන්තිකර්මයේ කිරි ඉතිරවීම සහ නුගේ හැල්ල වෙනුවෙන් ඉදිකෙරෙන සැරසිලි **දෙක** විස්තර කරන්න.

(iii) රටයකුම ශාන්තිකර්මය උපදේශන ක්‍රියාවලියකි. නානුමුරය හා දරුනැළවිල්ල ඇසුරෙන් සාකච්ඡා කරන්න.

[දෙවැනි පිටුව බලන්න.

**4.** රෝග නිවාරණයට බලපාන මනෝවිද්‍යාත්මක ප්‍රතිකාර ක්‍රමවේද ලෙස ශාන්තිකර්මයන්හි ගායන, වාදන සහ පසුබිම් අලංකරණ යොදාගෙන තිබේ.

(i) බලි ශාන්තිකර්මයේ ග්‍රහයන් **තිදෙනෙකුට** හිමි වර්ණ නම් කර එම වර්ණ සකස් කරගන්නා ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

(ii) සන්නි යකුමේ රංගනය තීව්‍ර කිරීම සඳහා බෙරවාදකයාගේ දායකත්වය විස්තර කරන්න.

(iii) කොහොඹා යක් කංකාරිය, දෙවොල් මඩුව, පහන් මඩුව යන ශාන්තිකර්ම අතුරෙන් **එකක්** තෝරාගෙන ඒ ආශ්‍රිත සැරසිලි විශේෂතා **හතරක්** විමසුමට ලක් කරන්න.

**5.** (i) ලී කෙළි සහ කෝලාට්ටම්, කුලු සහ සුලකු, කළගෙඩි සහ චෙම්බු යන සිංහල සහ දෙමළ ගැමි නැටුම්වල වෙනස්කම් දැකිය හැකි ය. විස්තර කරන්න.

(ii) පොත්කඩේ යක්කමෙහි නිරූපිත සමාජ සාරධර්ම **තුනක්** පැහැදිලි කරන්න.

(iii) පහත දැක්වෙන කරුණු ඇසුරෙන් රිරි යක් සහ ජස චරිතවල වෙනස්කම් සංසන්දනාත්මකව විග්‍රහ කරන්න.

(අ) ගායන, වාදන, නර්තන

(ආ) රංග වස්ත්‍රාභරණ

## III කොටස

**6.** පහත සඳහන් වගුවෙහි **(අ)**, **(ආ)** සහ **(ඉ)** යන කොටස් ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| **(අ) කොටස** | **(ආ) කොටස** | **(ඉ) කොටස** |
|---|---|---|
| ජතිස්වරම් | ශාප්මෝචන් | මහා පීටර් |
| පදම් | ලෝමහංස | චෙකොව්ස්කි |
| ආමද් | පටාචාරා | III හෙන්රි |
| තෝඩායම් | චිත්‍රාංගදා | ජෝර්ජ් නොවැර් |

(i) **(අ)** කොටස - කථක් නර්තන සම්ප්‍රදායට අයත් නර්තනාංගය තෝරාගෙන විස්තර කරන්න.

(ii) **(ආ)** කොටස - දේශීය මුද්‍රා නාට්‍ය කෘතිය තෝරාගෙන එහි රංග රචනය විමසන්න.

(iii) **(ඉ)** කොටස - හංසවිල බැලේ නාට්‍යයේ සංගීත ශිල්පියා හඳුනාගෙන ඔහුගේ නිර්මාණ ඇගයීමට ලක් කරන්න.

**7.** ශ්‍රී ලාංකේය නර්තනාංග ප්‍රාසංගිකව ඉදිරිපත් කිරීමේදී දේශීය අනන්‍ය ලක්ෂණ ආරක්ෂා කරගැනීම වැදගත් වේ.

(i) බැරිසිල් කලා කෘතියේ චරිත නිරූපණයේ දැකිය හැකි උපහාසාත්මක ලක්ෂණ පැහැදිලි කරන්න.

(ii) නර්තන කලාවේ නූතන ප්‍රවණතා සාම්ප්‍රදායික නර්තනය කෙරෙහි බලපාන ආකාරය නර්තන රචනය සහ රංග වස්ත්‍රාභරණ ඇසුරෙන් සාකච්ඡා කරන්න.

(iii) රියැලිටි තරග පැවැත්වීම මගින් දේශීය නර්තනයට සිදුවිය හැකි අයහපත වලක්වා ගැනීම සඳහා උචිත යෝජනා **හතරක්** සාකච්ඡා කරන්න.

**8.** නූතන තාක්ෂණික මෙවලම් භාවිතය නිසා නර්තන කලාව ජනප්‍රියත්වයට පත්ව තිබේ.

(i) අංගරචනය හා රංග වස්ත්‍රාභරණ නිර්මාණ ඇසුරෙන් ඉහත ප්‍රකාශය සාකච්ඡා කරන්න.

(ii) රංගාලෝකකරණය හා ශබ්ද පරිපාලනය ඇසුරෙන් ඉහත ප්‍රකාශය විමසුමට ලක් කරන්න.

(iii) සාම්ප්‍රදායික රඟමඩලේ නර්තනාංග සහ ප්‍රාසංගික වේදිකාවේ නිර්මාණ සංසන්දනය කරමින් ඉහත ප්‍රකාශය විචාරයට ලක් කරන්න.

* * *